# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/8 - 2021 ජුනි මස 09 වැනි බදාදා - 2021.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 78

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින්, ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව (Liquefied Petroleum Gas) (LPG) අඩංගු කි.ග්‍රෑම් 12.5 බරැති ගෘහස්ථ ගෑස් සිලින්ඩර, දිවයින පුරා සියලු ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු අලෙවිසැල් තුළ මිලදී ගැනීම සඳහා තිබිය යුතු බවට සියලු ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු (Liquefied Petroleum Gas) (LPG) ගෘහස්ථ සිලින්ඩර නිෂ්පාදකයින් හා වෙළෙඳුන් වෙත, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් විධාන කරනු ලැබේ.

තව ද, ශ්‍රී ලංකාව ඇතුළත වෙළඳාම් කිරීමේ කාර්යය සඳහා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව (Liquefied Petroleum Gas) (LPG) අඩංගු කි. ග්‍රෑම් 12.5 බරැති ගෘහස්ථ ගෑස් සිලින්ඩර තම සන්තකයෙහි හෝ භාරයෙහි හෝ තම පාලනය යටතේ ඇති කිසිම වෙළෙන්දෙකු විසින් ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව (Liquefied Petroleum Gas) (LPG) අඩංගු කි. ග්‍රෑම් 12.5 බරැති ගෘහස්ථ ගෑස් සිලින්ඩර විකිණීම ප්‍රතික්ෂේප කිරීම හෝ එම සිලින්ඩර මිලදී නොගැනීමට සෘජුව හෝ වක්‍රාකාරයෙන් පාරිභෝගිකයින්ට බලපෑම් කිරීම නොකළ යුතු ය.

මෙම විධානය වර්ෂ 2021 ජුනි මස 09 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක *(විශ්‍රාමික)*,
සභාපති.

2021 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

06 - 255


1A - PG 5459 — 225 (2021/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*